// Masthead
# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1725/3 - 2011 සැප්තැම්බර් 26 වැනි සඳුදා - 2011.09.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/2003.

**2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනතේ, 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධිකරණ අමාත්‍ය රවුෆ් හකීම් වන මම, මේ නියමය මගින් ඉහත කී පනතේ විධිවිධාන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ තායිලන්ත ආණ්ඩුව අතර 2004 ජුලි මස 30 වැනි දින බැංකොක්හි දී ඇතිකර ගනු ලැබූ ගිවිසුම සම්බන්ධයෙන් අදාළ වන බවට ප්‍රකාශයට පත් කරමි. ශ්‍රී ලංකා ආණ්ඩුව සහ පොදු රාජ්‍ය මණ්ඩලීය රටක් නොවන තායිලන්ත ආණ්ඩුව අතර ඇතිකර ගනු ලබන මෙම ගිවිසුම, සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය නෛතික සහයෝගය ලබාදීම සම්බන්ධයෙන් අදාළ වන අතර එය වෙනත් කරුණු අතර විමර්ශනය, නඩු පැවරීම හා අපරාධ වැළැක්වීම සම්බන්ධයෙන් ගිවිසුමට අදාළ පාර්ශ්වයන් දෙක විසින් නීතිය ක්‍රියාත්මක කිරීමට අදාළ ඵලදායී බව සහයෝගීතාව තුළින් වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් ද අදාළ වේ.

අබ්දුල් රවුෆ් හකීම්,
අධිකරණ අමාත්‍ය.

2011 සැප්තැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

10-219

1A - G 15111— 385 (2011/09)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.